# මහවැලි, කෘෂිකර්ම, වාරිමාර්ග සහ ග්‍රාමීය සංවර්ධන අමාත්‍යාංශය

**மகாவலி ,கமத்தொழில், நீர்ப்பாசனம் மற்றும் கிராமிய அபிவிருத்தி அமைச்சு**

**Ministry of Mahaweli, Agriculture, Irrigation and Rural Development**

## (කෘෂිකර්ම අංශය / விவசாயப் பிரிவு / Agriculture Division)

නො. 288, ශ්‍රී ජයවර්ධනපුර මාවත, රාජගිරිය, ශ්‍රී ලංකාව.
இல. 288, ஸ்ரீ ஜயவர்தனபுர மாவத்தை, ராஜகிரிய, இலங்கை.
No. 288, Sri Jayawardenepura Mawatha, Rajagiriya, Sri Lanka.


මගේ අංකය. / எனது இல. / My No. 7/1/3/2020 යල / චක්‍රලේඛ    ඔබේ අංකය. / உமது இல. / Your No.    දිනය. / திகதி. / Date. 2020.03.18

ගොවිජන සංවර්ධන කොමසාරිස් ජනරාල්,
සියලුම දිස්ත්‍රික් භාර ගොවිජන සංවර්ධන
නියෝජ්‍ය / සහකාර කොමසාරිස්වරුන්,
සියලුම ගොවිජන සංවර්ධන ප්‍රාදේශීය නිලධාරින්,

මහවැලි අධ්‍යක්ෂ ජනරාල්,
වාරි කළමනාකරණ අංශයේ අධ්‍යක්ෂ,

කෘෂිකර්ම අධ්‍යක්ෂ ජනරාල්,
පළාත් කෘෂිකර්ම අධ්‍යක්ෂවරුන්,

සභාපති, ලංකා පොහොර සමාගම,
සභාපති, කොළඹ කොමර්ෂල් පොහොර සමාගම,

***<u>නොමිලේ පොහොර බෙදාහැරීමේ චක්‍රලේඛ 5 / 2020 - සංශෝධන (I) - 2020 යල කන්නය</u>***

1. මහවැලි, කෘෂිකර්ම, වාරිමාර්ග සහ ග්‍රාමීය සංවර්ධන අමාත්‍යාංශය මගින් නිකුත් කරන ලද, 2020 යල කන්නයේ වී ගොවිතැන සඳහා නොමිලේ පොහොර බෙදාහැරීමේ උපදෙස් ඇතුළත් **නොමිලේ *පොහොර බෙදාහැරීමේ චක්‍රලේඛ : 5 / 2020*** හි **2.1** සහ **13.1** වගන්ති මෙයින් **සංශෝධනය** කරනු ලැබේ. එයට අමතරව **සහනාධාර මත පොහොර බෙදාහැරීමේ *චක්‍රලේඛ : 4 / 2019*** හි සඳහන් **4.2.2.** සහ **11.5.** වගන්තිවල සංශෝධනයන් අළුතින් ඇතුළත් කරනු ලැබේ.

   2.1. කෘෂිකර්ම දෙපාර්තමේන්තුව යටතේ පවතින වී පර්යේෂණ හා සංවර්ධන ආයතන විසින් ලබා දී ඇති පොහොර නිර්දේශ පදනම් කර ගනිමින් පොහොර සහනාධාර වැඩසටහනට උපයෝගී කර ගැනීම සඳහා නිශ්චය කල පසුගිය 2019 / 20 මහ චක්‍රලේඛයට අදාළ උපලේඛන 01 හි සඳහන් පොහොර නිර්දේශයෙන් 5% ක් අඩුකර මෙම කන්නය සඳහා ද භාවිතා වන අතර ග්‍රාම නිලධාරි වසම් මට්ටමින් කෘෂිකර්ම දෙපාර්තමේන්තුව මගින් ප්‍රකාශයට පත් කර ඇති 2018 නව පොහොර නිර්දේශය දිවයිනේ සෑම දිස්ත්‍රික්කයකම තෝරාගත් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයකට අයත් ගොවිජන සේවා බල ප්‍රදේශයක අත්හදා බැලීමේ ආදර්ශන වශයෙන් ක්‍රියාත්මක කිරීමට එම ප්‍රදේශයේ කෘෂිකර්ම උපදේශක, ගොවිජන සංවර්ධන ප්‍රාදේශීය නිලධාරී සහ දිස්ත්‍රික් ගොවිජන සංවර්ධන නියෝජ්‍ය / සහකාර කොමසාරිස්වරුන් වග විය යුතුය.

   13.1. එක් එක් ගොවි මහතාට නිර්දේශිත ප්‍රමාණයට අනුව ඔහු / ඇය ට හිමි පොහොර ප්‍රමාණය නොමිලේ නිකුත් කිරීමට කටයුතු කල යුතු වේ. නිර්දේශිත පොහොර ප්‍රමාණය ඉක්මවා පොහොර භාවිතා කරන ගොවීන් හඳුනා ගැනීමට කෘෂිකර්ම පර්යේෂණ හා නිෂ්පාදන සහකාර කටයුතු කල යුතු වේ. එවැනි ගොවි මහතුන් සඳහා මීළඟ කන්නයේ දී සහනාධාර පොහොර නිකුත් නොකිරීමට වගබිය යුතුය. තවද යම් පොහොර ඌණතාවයක් නිරීක්ෂණය වන අවස්ථාවක අදාල ප්‍රදේශයේ කෘෂිකර්ම උපදේශකවරයාගේ නිරීක්ෂණ මත පරිසර හිතකාමී පොහොර නොමිලේ නිකුත් කිරීම සඳහා ජාතික පොහොර ලේකම් කාර්යාලයෙන් ඉල්ලීමක් කල යුතුය.

කරුණාකර අනෙක් පිට බලන්න


ලේකම් / செயலாளர் / Secretary — දුරකථන / தொலைபேசி / Telephone - 011-2879048; ඊ-මේල් / மின்னஞ்சல் / e-mail - secretary@agrimin.gov.lk; ෆැක්ස් / தொலைநகல் / Fax - 011-2863497

කාර්යාලය / அலுவலகம் / Office — දුරකථන / தொலைபேசி / Telephone - 011-2872093, 011-2872097; ඊ-මේල් / மின்னஞ்சல் / e-mail - info@agrimin.gov.lk; ෆැක්ස් / தொலைநகல் / Fax - 011-2868910